# කොළඹ නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරු සංගමය

**(ආරම්භය 1991 පෙබරවාරි 04 වන දින)**

**ව්‍යවස්ථාව**

**01. නම :** කොළඹ නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරු සංගමය

**02. ලිපිනය :** 909/10, කේ අදිකාරම් මාවත, ඇතුල්කෝට්ටේ

**03. ලාංඡනය :**

**04. ආදර්ශ පාඨය :** ධම්මචාරී සුඛං සේති : ධර්මානුකූලව හැසිරෙන තැනැත්තා සුවසේ කල් ගෙවයි.

**05. පරමාර්ථ :**

01. නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරු භවතුන් සංගමයක් වශයෙන් ඒකරාශිව තබා ගැනීම.

02. සාමාජික භවතුන් අතර සුහදතාවය පවත්වාගැනීමටත් ඔවුන්ගේ සුභසාධනයටත් කටයුතු කිරීම.

03. ආගමික හා සමාජ සේවා කාර්යයන් සඳහා සංගමයක් වශයෙන් සාමාජිකත්වය යොමු කිරීම

**06. සාමාජිකත්වය :** කොළඹ නාලන්දා විද්‍යාලයේ අවම වශයෙන් අවුරුදු තුනක (3) සේවයෙන් පසු එහිදිම විශ්‍රාම ලැබූ හෝ වෙනත් ආයතනයකින් විශ්‍රාම ලැබූ හෝ ගුරු භවතුන්ට සාමාජිකත්වය ලබා ගත හැක.

**07. සාමාජික මුදල :** රුපියල් දහසක් (1000/=) එකවර ගෙවා සාමාජිකත්වය ලබා ගත හැකිය. සාමාජිකත්වය ලබා වසරක් සම්පූර්ණ වූ දින සිට වසරකට රුපියල් දාහක් (1000/=) බැගින් වසරක් පාසා දායක මුදල් ගෙවිය යුතුය.

**08. නිළධාරී මණ්ඩලය:**

01. අනුශාසකවරු - සංගමයේ සාමාජිකත්වය ලබා ගත් නාලන්දා විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරු
02. සභාපති
03. උප සභාපතිවරුන් දෙදෙනෙක්
04. ලේකම්
05. උප ලේකම්
06. භාණ්ඩාගාරික

07. උප භාණ්ඩාගාරික

08. ගිණුම් පරීක්ෂක

09. සංස්කාරක

සාමාජිකයින් පස්(5) දෙනෙක් සහ සාමාජිකාවන් පස් (5) දෙනෙක් ඇතුළු කාරක සභිකයින් දස දෙනෙක් (10) සමඟ දහනව (19) දෙනෙකුගෙන් විධායක කමිටුව සමන්විත විය යුතුයි.

- ❖ සංගමයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරු වලට පත්වීමට අවම වශයෙන් අවුරුදු තුනක් (3) වත් කාරක සභාවේ සාමාජිකත්වය දරා තිබිය යුතුය.
- ❖ කාරක සභාවට පත්වීමට අවම වශයෙන් අවුරුදු දෙකක්තවත් සාමාජිකත්වය දරා තිබිය යුතුය.
- ❖ තනතුරු වෙනස් කිරීමේදී සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු වලින් එක් වසරකදී වෙනස් කළ හැක්කේ එක් තනතුරක් පමණි.

### 09. වාර්ෂික මහ සභා රැස්වීම

සෑම වසරකම පෙබරවාරි මස අවසන් වීමට පෙර වාර්ෂික මහ සභා රැස්විම පැවැත්විය යුතුය. කැඳවීමේ ලිපිය දින 14 පෙර සාමාජිකයන්ට යැවිය යුතුයි. අදාළ වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්ෂික වැඩ වාර්තාවද ඉකුත් වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාවද, ගරු ලේකම් විසින් මෙහිදී ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික රැස්වීමට අවශ්‍ය ගණපූර්ණය මුළු සාමාජික සංඛයාවෙන් 1/3 ක් (තුනෙන් එකක්) විය යුතුය. අභිනව වර්ෂය සඳහා නිළධාරින් තෝරා ගැනීමද මෙම රැස්වීමේ දී සිදුකළ යුතුය. සාමාජික භවතුන් මෙදින ඉදිරිපත් කිරීමට බලාපෙරොත්තු වන යෝජනා වාර්ෂික රැස්වීමට දින 7 කට කලින් ලේකම් වෙත එවිය යුතුය. එසේ ඉදිරිපත් කරන යෝජනා විධායක කමිටුව අනුමත කලොත් පමණක් වාර්ෂික මහ සභා රැස්විමට ඉදිරිපත් කිරිමට හැකිය.

### 10. විධායක කමිටු රැස්වීම

විධායක කමිටු රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතුය. එහි ගණපූර්ණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව (10) දහයකි. මාසික රැස්වීම් වලට අමතරව අවශ්‍යතාවයන් අනුව විශේෂ කමිටු රැස්වීම් කැඳවිය හැක. රැස්වීම් කැඳවිය යුත්තේ සභාපති හා භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව ලේකම් විසිනි. සාමාජිකත්වයෙන් තුනෙන් එකක සාධාරණ ඉල්ලීමක් මත විශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමට කමිටුවට බලය තිබේ.

## 11. සංගමයේ මුදල්

01. සංගමයට ලැබෙන සෑම මුදලක් සඳහාම සංගමයේ මුද්‍රිත ලදුපතක් භාණ්ඩාගාරික විසින් නිකුත් කළ යුතුය.

02. සංගමයට ලැබෙන මුදල් විධායක කමිටුව අනුමත කරන බැංකු ගිණුම්වල තැන්පත් කළ යුතුය.

03. මුදල් ආපසු ලබා ගැනීමේදී භාණ්ඩාගාරිකගේ අත්සන සහ සභාපති/ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයෙකුගේ අත්සනද තිබිය යුතුය.

04. සංගමයේ මුදල් වර්ෂය පෙබරවාරි මස 01 වැනිදා සිට ඊළඟ වසරේ ජනවාරි මස 31 වැනිදා දක්වා වේ.

05. විගණනය කරන ලද ගිණුම් වාර්තාව වාර්ෂික මහ සභා රැස්වීමේදී භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතුය.

06. සංගමයේ එදිනෙදා වියදම් සඳහා රුපියල් පන්දහසක (5000/=) ට නොවැඩි මුදලක් භාණ්ඩාගාරික ළඟ තබාගත හැක.

07. විධායක කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව භාණ්ඩාගාරිකට එක් වතාවකදී වියදම් කළ හැකි මුදල රුපියල් දසදහසකි (10,000/=) කි.

    ඒ සඳහා සභාපතිගේ හා ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේ කරනු ලබන වියදම් සඳහා ඊළඟ කමිටු සභා රැස්වීමේදී අනුමැතිය ලබා ගත යුතුය.

08. විධායක කමිටු රැස්වීමේදී මාසික අයවැය වාර්තාවක් භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතුය.

09. සංගමයේ මුදල් ගණුදෙනු පිළිබඳ සියලුම ලියකියවිලි වල පිටපත් අඩංගු ලිපි ගොනුවක් ලේකම් භාරයේ තැබිය යුතුය.

## 12. සංගමයේ කෙරෙන වියදම් හා ප්‍රදානයන්

**වාර්ෂික පරිත්‍යාග**

01. වාර්ෂික සභා රැස්වීමට පෙර සංගම් මූලස්ථානයේ හෝ වෙනත් සුදුසු ස්ථානයක මහා සංඝරත්නය විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිනාවක් පිරිනැමීම.

02. පැල්මඩුල්ලේ මිතුරු මිතුරෝ ආයතනය මඟින් වාර්ෂික පවත්වන ගුරු උපහාර උළලේදී එම ආයතනයට පරිත්‍යාගයක් කිරිම.

03. සර්වෝදය සුවසෙත ළමා නිවාසයට වාර්ෂිකව රුපියල් දෙදාහක (2000/=) මුදල් පරිත්‍යාගයක් කිරිම.

04. රාජගිරියේ වික්ටෝරියා නිවාසයේ රෝගීන්ට වාර්ෂිකව ජනවාරි මස 25 වැනිදා දිවා ආහාර සඳහා බර පැන දැරීම.

**අවමංගල්‍යාධාර පිරිනැමීම**

01. සාමාජික භවතුන්ගේ අභාවයකදී රුපියල් පහලොස්දහසක් (රු.15,000/=) මුදලක් පරිත්‍යාග කිරීම.

02. මෙහිදී සාමාජිකත්වයේ කාල සීමාව ගැන සැලකිලිමත් නොකෙරේ.

03. මුදල් ලබා දෙන්නේ සාමාජිකයාගේ කලත්‍රයාට හෝ එම පවුලේ මව පියා හෝ දරුවෙකු වෙත පමණි.

04. එම සාමාජිකයාගේ අවමංගල අවස්ථාවට සංගමය නියෝජනය වන පරිදි සහභාගී වන කණ්ඩායමේ ගමන් වියදම් සංගමයෙන් ගෙවිය යුතුය.

**වෛද්‍යාධාර පිරිනැමීම**

01. සාමාජික භවතකු රෝගාතුර වූ බව විධායක කමිටුව දැනුවත් වූ විට ඔහු/ඇය වෙනුවෙන් රුපියල් පහළොස් දහසක (15,000/=) ආධාර මුදලක් පිරිනැමීමට කටයුතු කරනු ඇත.

02. වෛද්‍යාධාර ලැබීමට අවම වශයෙන් වසරක සාමාජිකත්වයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සාමාජිකත්වයේ වසරකට රු. 1,500/= බැගින් උපරිමය රු. 15,000/= කට යටත්ව පිරිනැමිය යුතු ආධාර මුදල විධායක කමිටුව විසින් තීරණය කරනු ඇත.
සාමාජිකයෙකුට හිමිකම් ඇත්තේ වෛද්‍යාධාර හෝ අවමංගල්‍යාධාර යන දෙකෙන් එකකට පමණි.
සියළුම පරිත්‍යාගයන් සංගමයේ පරමාර්ථයන්ට අනුකූලව අරමුදලේ තත්ත්වය අනුව විධායක කමිටුවේ ඒකමතික තීරණය මත කළ යුතුය.

**13. වාර්ෂික චාරිකා**

01. සංගමය සංවිධානය කරන සාමාජිකත්වයට පමණක් සීමා වූ එක්දින චාරිකාවේ හා සුහද හමුවේ පිරිවැයෙන් කොටසක් අවශ්‍ය පරිදි සංගමයෙන් දැරිය යුතුය.

02. ඒක පුද්ගල සම්පූර්ණ මුදල ගෙවා කාලත්‍රයාට ද මෙම අවස්ථාවන්ට සහභාගී විය හැක.

03. මෙයට අමතරව වසරකට දින දෙකේ හෝ තුනේ චාරිකා සංවිධානය කිරීම. මෙම චාරිකාවලට සාමාජිකයා සමඟ කාලාත්‍රයාට පමණක් සහභාගී විය හැක. මෙම චාරිකා වලදී සියලුම වියදම් සහභාගීවන්නන් විසින් දැරිය යුතුය.

- ❖ ව්‍යවස්ථා සංශෝධනයක් කළ හැක්කේ වාර්ෂික මහා සභා රැස්වීමේදී තුනෙන් දෙකක (2/3) බහුතර ඡන්දයකින් පමණි.
- ❖ මෙම මූලික ව්‍යවස්ථාවේ දෙවන සංශෝධන 2014.02.23 වන දින සිට ක්‍රියාත්මකයි.

# නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික  ගුරු සංගමය

2016.01.30 දින විධායක කමිටුව සම්මත කළ ව්‍යවස්ථා සංශෝධනය

**3 වන ව්‍යවස්ථා සංශෝධනය**

**විශේෂ වෛද්‍ය ආධාර අරමුදල**

## අරමුණ

බරපතල රෝගී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන සාමාජික සාමාජිකාවන්ට ආර්ථික සහනයක් ලබා දීම.

## අරමුදල් සපයා ගැනීම

2016 මාර්තු 01 වන දිනට සංගමය සතු මුදලින් රුපියල් ලක්ෂ දෙකක් (රු. 200,000/=) යොදවා මෙම අරමුදල ආරම්භ කරන අතර ආදි සිසුන්ගෙන් පරිත්‍යාගශීලීන්ගෙන් හා සහෝදර සාමාජික සාමාජිකාවන්ගෙන් ලැබෙන පරිත්‍යාග මුදලින් අරමුදල තරකර ගැනීමට අපේක්ෂා කෙරේ.  සම්පත් බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ  006160000218 දරණ  ගිණුමෙන් අදාළ අරමුදලේ ගණුදෙනු සිදු කෙරේ.

## මුල්‍ය ආධාර ගෙවීම

(i) වෛද්‍යාධාර/අවමංගල්‍යාධාර හා විශේෂ වෛද්‍යාධාර සඳහා හිමිකම් ලබන්නේ සංගමයේ සක්‍රිය  සාමාජිකයන් පමණි. (සක්‍රීය සාමාජිකයා යනු අදාළ මුදල් වර්ෂය දක්වා අඛණ්ඩව වාර්ෂික  සංමාජික මුදල් ගෙවා ඇති අය වේ.)

(ii) විශේෂ වෛද්‍යාධාරය ලබා දෙනුයේ සංගමයෙන් දැනට ලබා දෙන වෛද්‍යාධාර මුදලට අමතරවය.

(iii) සාමාන්‍ය  වෛද්‍යාධාර/ අවමංගල්‍යාධාර හා විශේෂ වෛද්‍යාධාර ගෙවනුයේ සාමාජිකයෙකුට  එක් වරක් පමණි.

(iv) විශේෂ  වෛද්‍යාධාර ලැබීමට  සාමාජිකත්වය  ලබා වර්ෂයක් සම්පූර්ණ වී තිබිය යුතුය. විශේෂ  වෛද්‍යාධාර එක් වර්ෂයකට රු. දසදහසක (රු.10,000) උපරිමයකට යටත්ව  වර්ෂ 5 ක් සඳහා රු. පනස්දහසක් (රු. 50,000/=)  ක් වේ. සාමාජිකත්වය ලැබීමෙන් පසු

| | |
|---|---|
| 2 වන වර්ෂය | රු. 10,000.00 |
| 3 වන වර්ෂය | රු. 20,000.00 |
| 4 වන වර්ෂය | රු. 30,000.00 |
| 5 වන වර්ෂය | රු. 40,000.00 |
| 6 වන වර්ෂයට හා ඉන් පසුව | රු. 50,000.00 වශයෙනි. |

**01.** **විශේෂ වෛද්‍ය ආධාර මුදල් ගෙවීම**

ගරු අනුශාසකවරයෙක්, සභාපති, උප සභාපතිවරුන්, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික යන අයගෙන් සමන්විත විශේෂ මණ්ඩලයක් මඟින් සිදු කළ යුතුය. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු අවම වශයෙන් 5 දෙනෙකුගෙන් ගණ පූරණය තිබිය යුතුය.

**02.** **විශේෂ වෛද්‍යාධාර අපේක්ෂා කරන සාමාජික භවතුන් ලේකම් මහතා දැනුවත් කළ යුතුය. ඒ සමඟ පහත සඳහන් ලේඛනවල ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

i) වෛද්‍ය නිර්දේශ හා වෛද්‍ය වාර්තා
ii) රෝහල් බිල්පත
iii) ඖෂධ වට්ටෝරු
iv) ඖෂධ මිලදී ගත් බිල්පත්
v) වෙනත් අදාළ වේ යැයි සැලකෙන ලේඛන

මණ්ඩලයේ තීරණය ලිඛිත විය යුතු අතර, එම ප්‍රකාශය ඊළඟ විධායක කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

එම ප්‍රකාශයේ :

(i) වෛද්‍යාධාර ලාභියාගේ නම සහ සාමාජික අංකය
(ii) වෛද්‍ය වාර්තා අනුව රෝගය
(iii) ප්‍රතිකාර සඳහා වැය කර ඇති මුදල
(iv) ලදුපත් වලින් තහවුරු වී ඇති වියදම
(v) අනුමත කළ වෛද්‍ය ආධාර මුදල
(vi) කමිටු සාමාජිකයන්ගේ අත්සන්

සාමාජිකයාට පුද්ගලිකව වෛද්‍යාධාර ඉල්ලීමට අපහසු අවස්ථාවකදී ඔහු/ඇය වෙනුවෙන් සක්‍රීය සාමාජිකයන් 2 කුගේ අත්සන් සහිතව ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැක.

**03.** **අංක 2 සඳහන් සුදුසුකම් සපුරා නැති වුවද රෝගියා අසාධ්‍ය තත්ත්වයේ පසුවන්නේ නම් වෛද්‍යාධාර පිරිනැමීම පිළිබඳ තීරණයක් ගැනීමට අනුකාරක සභාවට බලය තිබේ.**

මණ්ඩලය විසින් අනුමත කළ වෛද්‍යාධාර මුදල තමාට හිමි විය යුතු ආධාර මුදලට වඩා අඩු නම් පසුව රෝගී අවස්ථාවකදී හිමිකම් සඳහා අයදුම් කළ හැක.

**සාමාජිකත්වය :** වාර්ෂික සාමාජික මුදල් නොගෙවීමේ හේතුවෙන් සාමාජිකත්වය අක්‍රීය වූ විට, අදාළ වර්ෂයේ මාර්තු 31 ට පෙර සියලුම හිඟ සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය සක්‍රිය කර ගත හැක.

- විශ්‍රාම ගැනීමෙන් පසු වර්ෂයක් ඇතුළත සාමාජිකත්වය ලබා ගත යුතුය.
- සාමාජිකත්වය ලබා ගත් දින සිට අඛණ්ඩ වසර 20 ක් සාමාජික මුදල් ගෙවා ඇති හෝ වයස අවුරුදු 80 සම්පූර්ණ වූ සාමාජික භවතුන් ඉන් ඉදිරියට සාමාජික මුදල් ගෙවීමෙන් නිදහස්වන අතර, සියලුම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි.

## 4 වන ව්‍යවස්ථා සංශෝධනය ( 2018.02.25 දින සිට ක්‍රියාත්මකයි)

**4.1 සංගමයේ නම** : නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරු-ආදි ගුරු සංගමය.

**4.2 අ) සාමාජිකත්වය** : නාලන්දා විද්‍යාලයේ අවම වශයෙන් වසර 3 (තුනක්) ක් අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ස්ථාන මාරුලැබ ඉවත්ව යන විදුහල්පතිවරුන්ට සහ ගුරු භවතුන්ටද, සංගමයේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

4.2 ආ) 2016.03.01 දින අනුමත වූ සංශෝධිත ව්‍යවස්ථාවේ සාමාජිකත්වය යටතේ ඇති විශ්‍රාම ගැනීමෙන් පසු **වසරක් ඇතුළත සාමාජිකත්වය ලබා ගත යුතුය යන වගන්තිය අහෝසි කිරිම.**

4.2 ඇ) වයස අවුරුදු හැට (60) ඉක්මවූ අය සංගමයට බඳවා ගනු නොලැබේ. එහෙත් හැට ඉක්මවූ විශ්‍රාමිකයාගේ අයදුම්පත ගැන සාධාරණව සලකා බලා ඔහු හෝ ඇය සංගමයට බඳවා ගැනීමට විධායක කමිටුවට බලය තිබේ. එම අවස්ථාවේදී අයදුම්කරු වයස අවු. 60 සිට අයදුම්කරන දිනය දක්වා වසරකට රු. 1,000/= බැගින් වූ සම්පූර්ණ සාමාජික මුදල එකවර ගෙවිය යුතුය. ඉන්පසු වාර්ෂික සාමාජික මුදල් ගෙවිය යුතුය.

4.2 ඈ) සාමාජිකත්වය ලබාගත් දින සිට වසර 20 ක් නොකඩවා සාමාජිකත්වය රැකගත් සාමාජිකයාට වසර 20 සම්පූර්ණ වූ දින සිට යාවජීව සාමාජිකත්වය හිමි වේ. එදින සිට ඔහු හෝ ඇය වාර්ෂික සාමාජික මුදල් ගෙවීමෙන් නිදහස් කෙරේ.

4.2 ඉ) **අක්‍රීය සාමාජිකත්වය -** යම් සාමාජිකයෙකු අදාළ වර්ෂයේ පෙබරවාරි 1 දින සිට **අඛණ්ඩව වර්ෂ තුනක්** සාමාජික මුදල් ගෙවා නැතිවිට, **අක්‍රිය සාමාජික තත්ත්වයට පත්වේ.**

අක්‍රිය සාමාජිකයන්ට මහා සභා රැස්වීම පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකලද , එම කාලය තුළ සාමාජිකත්වයට හිමි **සෙසු සියලු වරප්‍රසාද අහිමිවේ.** නමුත් ඕනෑම අවස්ථාවක අදාළ **හිඟ මුදල් ගෙවීමෙන් පසු සිය සාමාජිකත්වය සක්‍රිය කරගත හැකිය.**

4.3 **විධායක කමිටුවට පත්වීම :** වසර 3 ක සාමාජිකත්වය සම්පූර්ණ කළ විශ්‍රාමික ගුරුභවතුන්ට සහ විශ්‍රාම ගැනීමෙන් පසු වසර 3 ක් සාමාජිකත්වයේ රැඳී සිටි ආදි ගුරු භවතුන්ටද විධායක කමිටුවේ කාරක සභාවට පත්විය හැක.

4.4 ආදිගුරු භවතුන්ද විශ්‍රාම ගැනීමෙන් පසු "විශ්‍රාමික ගුරු" ගණයට ඇතුළත් වේ.

ගරු ලේකම්
එස්.කේ.ගුරුසිංහ

2018.02.25